# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 25/09/2024 පැය

**මාධ්‍ය නිවේදනය**

**පොලිස් නිලධාරියෙකුට අල්ලස් ලබාදීම සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට - මාතලේ පොලිස් ස්ථානය.**

2024.09.24 වන දින උදෑසන කාලයේ මාතලේ පොලිස් ස්ථානය වෙත පැමිණි පුද්ගලයෙකු තමන් පුද්ගලික බැංකුවක වාහන අත්පත් කරගැනීමේ නියෝජිතයෙකු බවත්, මාතලේ පොලිස් වසමේ දොඔගස්දෙණිය ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකු සතු ලොරි රථයක් අත්පත් කරගැනිම සඳහා අවශ්‍ය බවට මාතලේ පොලිස් ස්ථානයේ නිලධාරින් වෙත දන්වා ඇත. ඒ සඳහා බලය පැවරීමේ ලිපියක් ද පෙන්වමින් පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් සිදුකිරීමට අවශ්‍ය බවට එම පුද්ගලයා විසින් දන්වා ඇත. එහිදි ලිපිය පරීක්ෂා කළ මාතලේ පොලිස් ස්ථානයේ විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපතිවරයා විසින් එම ලිපිය නිකුත් කළ තැනැත්තාගේ නමක් හො නිල මුද්‍රාවක් නොමැති වීම හේතුවෙන් අදාල පුද්ගලික බැංකුවේ මාතලේ ශාඛාවෙන් එම ලිපිය වගකිවයුතු නිලධාරියෙකුගෙන් අත්සන් කර රැගෙන එන ලෙස දන්වා ඇත.

එම අවස්ථාවේ එම පුද්ගලයා එම උපදෙස් ක්‍රියා නොකර ප්‍රමාද නොකර පැමිණිල්ල සටහන් කර දෙන ලෙස ආයාචනය කරමින් විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපතිවරයා ලෙස කටයුතු කළ ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයාට ලිපිගොනු අතර තබා රුපියල් 5000/= ක අල්ලස් මුදලක් ලබාදී ඇත. එහිදී 2023 අංක 09 දරණ දූෂණ විරෝධී පනතේ වගන්ති 99(අ) යටතේ රජයේ නිලධාරියෙකුට අල්ලස් ලබාදීම , පොලිස් නිලධාරියකු ඉදිරිපිට සංඥය වරදක් සිදුකිරීම යන වැරදි සම්බන්ධයෙන් එම පුද්ගලයා අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන මාපාකන්ද උතුර, නාවලපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මාතලේ පොලිසිය වැඩිදුර විමර්ශනය සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**